**<u>මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ පරිශ්‍රයේ හා ඉසිපතන නිල නිවාසයේ උද්‍යාන අලංකරණ කටයුතු පවත්වාගෙන යාම සඳහා සුදුසු ආයතනයක් තෝරා ගැනීම සම්බන්ධයෙන් වන ප්‍රසම්පාදනය - 2026/2027</u>**

## <u>Bid No. MOF/Shopping/13/39/2026</u>

උක්ත ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් 2026.07.02 දිනැතිව අමාත්‍යාංශ වෙබ් අඩවියේ පල කරන ලද ලංසු ආරාධනය හා බැඳේ.

02. එමගින් මෙම අමාත්‍යාංශ පරිශ්‍රයේ හා ඉසිපතන නිල නිවාසයේ උද්‍යාන අලංකරණ කටයුතු පවත්වාගෙන යාම සඳහා සුදුසු ආයතනයක් තෝරා ගැනීමට මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවන බව දැනුම්දී ඇති අතර එම ප්‍රසම්පාදනයට අදාළ පූර්ව ලංසු රැස්වීම 2026.07.03 දින මෙම අමාත්‍යාංශයේදී පවත්වන ලදී.

03. එම පූර්ව ලංසු රැස්වීමේදී සාකච්ඡා කළ කරුණු අනුව, ඔබ වෙත නිකුත් කර ඇති ප්‍රසම්පාදන ලේඛනවල සංශෝධනයන් සිදුකර **අතිරේකයක්** ලෙස නව ප්‍රසම්පාදන ලේඛනයක් නිකුත් කිරීමට අමාත්‍යාංශ සුළු ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර ඇත. ඒ අනුව, මෙම ප්‍රසම්පාදනයට අදාළව මේ වන විටත් ඔබ වෙත ප්‍රසම්පාදන ලේඛනයක් ලැබී ඇත්නම් එය නොසලකා හරින ලෙසත් නව ප්‍රසම්පාදන ලේඛනයක් පසුව ඔබ වෙත නිකුත් කිරීමට අපේක්ෂා කරන බවත් කාරුණිකව දන්වමි.

04. එමෙන්ම මෙම ප්‍රසම්පාදනයට අදාළ ලංසු විවෘත කිරීම 2026.07.09 දින සිදු කිරීමට කටයුතු සූදානම් කර තිබුණද නව ප්‍රසම්පාදන ලේඛනයක් අතිරේකයක් ලෙස නිකුත් කිරීමට තීරණය කර ඇති බැවින් එදිනට ලංසු විවෘත කිරීම සිදු නොකරන බවත් මෙයින් දැනුම් දෙමි. තවද, නව ප්‍රසම්පාදන ලේඛනය ඔබ වෙත නිකුත් කිරීමේදී එම ලංසු විවෘත කරන දිනය ඔබ වෙත දැනුම් දීමට කටයුතු කරන බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

වැඩිදුර තොරතුරු විමසීමට අවශ්‍ය වන්නේ නම්, ප්‍රධාන ගණකාධිකාරී - 011 2484535 හෝ ගණකාධිකාරී (සැපයුම්) - 011 2484538 අමතන්න.